## සුබ සරණ
Marriage Proposals

**වැදගත්**
මංගල දැන්වීම් සඳහා පිළිතුරු එවන විට ලියුම් කවරයේ හSMP අංකය පැහැදිළිව සඳහන් කරන්නට අමතක නොකරන්න අපේ ලිපිනය Sannasa 22 Lorne Street Lalor Vic 3075

ඔස්ට්‍රේලියාවේ ස්ථිර පදිංචි 37 වියැති කාර්මික අංශයේ රැකියාවක නියුතු මම සුදුසු සහකාරියක් සොයමි. ජාති ආගම් කුල භේද නොසැළකේ.
අමතන්න 0422 05 10 75 හෝ 03 9436 7536

NSMP 0009

A cousin lives in Melbourne seeks a Sinhalese, Buddhist, kind hearted, loving, caring, educated, employed, cultured partner between 46-50 years for her cousin, 45+ divorced, pretty, well mannered and employed overseas as an Executive. No encumbrances. Please Contact : imva342@yahoo.com

NSMP 0008

සිංහල, කතෝලික, දැනට ලංකාවේ පදිංචි, 31 හැවිරිදි, පරිගණක ග්‍රැෆික් ශිල්පිනියක ලෙස රැකියාව කරන, ජාත්‍යන්තර මොන්ටිසෝරි ඩිප්ලෝමාධාරී, සහෝදරයින් 4 දෙනෙකු සිටින පවුලේ එකම දියණිය වන, අත්සනට සීමා වූ විවාහයකින් වෙන්ව සිටින රූමත් නැගනියට සුදුසු සහකරුවකු ඔස්ට්‍රේලියාවේ පදිංචි ඥාති සොයුරිය සොයයි. . විමසීම් 03 9401 3727/0425 805 754

NSMP 0007

මෙල්බන්හි ගණකාධිකාරි උපාධියක් හදාරණ (ලන්ඩන්) වරලත් ලේකම් - දෙවන අදියර ශ්‍රී ලංකාවේදී විධායක ලේකම්වරියක ලෙස සේවය කළ බාල සොහොයුරියට සුදුසු සහකරුවෙකු ඔස්ට්‍රේලියාවේ ස්ථිර පදිංචි වැඩිමහල් සොයුරිය සොයයි. වයස 33, උස අඩි 5, තලෙලු පැහැති. අමතර රැකියාවක නියුතු ය.
ක්‍රිෂාන්ති 0269 261 597
ඊමේල් kumari_pp@yahoo.com

NSMP 0005

ශ්‍රී ලංකාවේ පදිංචි බොදු ගොවි 31 වියැති ගණකාධිකාරිනී දියනියට සුදුසු සහකරුවකු දෙමාපියෝ සොයති. විමසීම් 03 9807 8137

NSMP 0006

12 වන පිටෙන්

කොල්ලා වරින් වර පා පුවරුවට ගොඩ වෙමින් හති අරිමින් ඒ මුළු දුරම පයින් දුව ගෙන එයි.

කොළඹ වෙසෙන සියල්ලෝම එක් රැස් වන උද්‍යානය බඳු පිට කොටුවේ අමුත්තන්ට කුතුහලය දනවන බොහෝ දෑ විකිණීමට තිබේ. අඩියක් පමණ දිග අන්නාසි ගෙඩියක් පැන්සයකි. පොල් දහස් ගණනින් ගොඩ ගසා ඇත. කෙසෙල්, අල වර්ග, දෙල්, සහ රාත්තල් පහේ සිට පනහ දක්වා විවිධ බරින් යුත් කොස් ද ඇත. එමතුද නොව, එතරම් මිහිරි යයි කිව නොහැකි, කටු සහිත අනෝදා, පිට පොත්ත තද කොල පැහැති, දිගටි ඝන ඇටයක් මැදි කොට සැදුණු කෙඳි සහිත කහ පැහැති මදයකින් හා ටර්පන්ටයින් වැනි සුවඳකින් යුත්, වකු ගඩුවක හැඩය ගත් අඹ ද මේ වෙළඳ පොලේ තිබේ. ඒ ආසන්නයේම බටහිර ඉන්දීය කොදෙව් දූපත් වල ඇති ඒවාට වඩා අනර්ඝ දොඩම් සහ දෙහි වල සංකලනයක් බඳු වූ වැල් දෙහි, එතරම් හොඳින් නොවැඩුණු ඇපල්, කොල පැහැති තද ඝනකමින් යුත් විවිධ වර්ග වල දොඩම්, දෙහි, ජම්බු, පේර, අත්තික්කා, පැෂන් ෆෲට්, පැපොල් සහ ගහෙන් කැඩූ අළුත මදය අයිස් වතුර මෙන් සීතල, එමෙන්ම සුවඳ කැවූ හිම කැටි වැනි වු රසයකින් යුත් මැංගුස්ටින් ද විකිණීමට ඇත.

තරමක් ඈතින් ලෑල්ලක් මත විශාල ඉබ්බෙකි. පණ පිටින්ම කෑලි වලට කපා උඩු අතට හරවා තබා ඇත. පපුව, පෙනහළු ඇතුළු අනිකුත් ඉන්ද්‍රියයන් සියල්ලම විවෘතව පෙනේ. ඇත්තෙන්ම බොදුනුවන් පර පණ නසන්නේ නැත. ඔවුහු පර පණ නැසීමෙන් වලකිම් යන තේරුමින් යුත් ශික්ෂා පදයක් සමාදන් වෙති. නමුත් මේ ආකාරයට සතුන්ට උන්ගේ පණ නසනවාට වඩා දරුණු හිංසා පමුණුවති. මෙසේ කිරීමෙන් මස් කැබලි වඩා රසවත් වෙතැයි සිතති. වේදනාව පිළිබඳව වු එවැනිම උපේක්ෂාවකින් යුතුව තමා සතු ඌරාගේ ඉදිරිපස සහ පසුපස කකුල් බැඳ ඒ අතරින් පොල්ලක් රිංගවා කර තබා ගෙන ගෙදර ගෙන යති.

මිනිසුන්ගේ දෛනික ජීවිතයෙන් වැඩි කොටසක් සිදු වන්නේ පිටස්තර ලෝකයා ඉදිරියේ කල එළියේය. ඇහිරී ගිය පෙනුමින් යුතු ගෙතුල ආවරණය කිරීමට දොරවල් හෝ කවුළු පියන් පත් නැත. වැසිකිලිය ආශ්‍රිත කටයුතු

*ස්වදේශික ගැහැණු හා පිරිමි සිය අතිශය පෞද්ගලික කටයුතු පවා කිසිදු ලජ්ජාවකින් තොරව හා ඉතාමත්ම සාමාන්‍ය ලෙස දෙනෝ දාහක් මැද කරති.*

සාමාන්‍යයෙන් යුරෝපයේ නම් සිදු වන්නේ සෑහෙන පෞද්ගලිකත්වයකින් යුතුව වුවද, මෙහි එය මිනිසුන් ගැවසෙන එළි පහලියේ කරන දෙයකි. ස්වදේශික ගැහැණු හා පිරිමි සිය අතිශය පෞද්ගලික කටයුතු පවා කිසිදු ලජ්ජාවකින් තොරව හා ඉතාමත්ම සාමාන්‍ය ලෙස දෙනෝ දාහක් මැද කරති. තඹයෙන් කල මූර්ති කැටයමක් බඳු අයෙක් නිශ්චලව ගේ දොරකඩ වාඩි වී ලී දඬුවකින් දත් මදී. නුදුරින්ම ඇත්තේ ස්නානය කරන තැනකි. එහි පස්ස සේදීමද නෑමද කිසිදු විශේෂත්වයකින් හෝ නුදුරින් සිටගෙන සිටින්නන් පිළිබඳව තැකීමකින් හෝ තොරව සිදු වේ. සමහර විට ඔවුන් තමන් යෙදී සිටින කටයුත්ත කෙරෙහිම අවධානයෙන් සිටින හෙයින් තම අසල්වැසියා අතපය සෝදන ආකාරය ගැන නිනව්වක් නැතුවා විය හැකිය.


ස්වදේශික දරුවෝ - බ්‍රිතාන්‍ය පාලන යුගය

රාත්‍රිය එළඹි කල හෝ තෙත වස්සාන සුළං හමන කල ලණු පැදුරකින් නැතිනම් දැලකින් ගෙවල්වල ඉදිරිපස දොරවල් ආවරණය කරන නමුත් දීප්තිමත්ව දැවෙන ඉර එළිය ඇති මෙවන් මොහොතකදී කෙනෙකුට පවුල් ජීවිතයේ අතිශය රහසිගත ජවනිකා පවා පැහැදිලිව දැක බලා ගත හැකිය.

**සංචාරකයා දුටු කොළඹ-නුවර මග දෙපස තොරතුරු ලබන කලාපයෙන්**

# SANNASA Classifieds
## ලුහුඬු දැන්වීම්


### 2 Brand New apartments for rent in Kirillapone

Apartment 1 - Fully furnished throughout, 2BR's (both with ensuites with hot water, fans and mosquito nets), large family dining area, fully fitted pantry, TV, washing machine, fridge, iron, linen and garage. Rent Rs 40,000 /month.
Apartment 2 - (same as above but unfurnished) Rent Rs 25,000/month.
Air conditioning will be provided upon request, but extra charges will apply.
For details contact Sharmini on 001194112805884 or at guruder@bellmail.lk



### Large House for sale in Battaramulla

A new upstair house on 15 perches in Battaramulla with 4 bedrooms and 3 attached toilets, Large living and Dining rooms, pantry, servants room & toilet, garage, TV lounge, laundry, ironing area , 2 balconies, terrace, verandah, garden. Owners have not spared any expenses in building this home and now it could be yours! Imported bathroom fittings, Bay windows, Timber roof, parapet wall, telephone, tiled floors, grills. Close to all amenities 10 minutes to Overseas Children's School, 8 minutes to parliament. AUS$175,000 or best offer.
**Contact Ajith on 0409 027 830**

සන්නස
වෙළඳ දැන්වීම් සඳහා අමතන්න
03 9402 5380
0425 720 932

ශ්‍රී ලාංකික ඇට මිදුළු දායක ලේඛණයේ ලියාපදිංචි දායකයින් ගණන
597
ඇට මිදුළු/සම්භව සෛල දායකයකු ලෙස ලියාපදිංචි වන්න
ජීවිතයක් කොයි තරම් වටිනවද.?
ශ්‍රී ලාංකික ප්‍රජාවේ සාමූහික ප්‍රයත්නයක්